# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 28 දරන
# ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 ජූලි මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 ජූලි මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

**1993 අංක 28 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1993 ජූලි මස 16 වන දින]

එල්. ඩී.—ඕ. 87/92

**1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1993 අංක 28 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1989 අංක 7 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනතේ දීර්ඝ නාමයේ "පිළිවෙළින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පිළිවෙළින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ "එහෙත් 1993 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එහෙත් 1994 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (iii) වන ඡේදයේ "එහි ශේෂය ද ; සහ" යන වචන වෙනුවට "එහි ශේෂය ද ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (iv) වන ඡේදයේ "එහි ශේෂය ද" යන වචන වෙනුවට "එහි ශේෂයද ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; තව ද

(3) ඒ වගන්තියේ (iv) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(v) 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ මුදලින්—

(අ) සියයට පනහකට නොඅඩු ප්‍රමාණයක් 1993 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර ද ;

(ආ) 1993 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර එහි ශේෂය ද ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7½ ක් ; සහ", යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7½ ක් ;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ඈ) ඡේදයේ "ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7½" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7½ ක් ; සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඉ) 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඒ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් ඒ වර්ෂය වෙනුවෙන් අඩු කරනු ලැබිය යුතු සම්පූර්ණ ආදායම් බද්දෙන්—

(i) 1993 ජූලි මාසය සඳහා ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7½ ක් ; සහ

(ii) 1993 ඔක්තෝබර් මාසය සඳහා ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7½ ක්".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (ii) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ii) මේ පනත යටතේ අදාළ වර්ෂයක් සඳහා අධිභාරය ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින්—

(අ) 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන් 1988 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1989 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7½ කට නොඅඩු ප්‍රමාණයක් ; සහ

(ii) 1989 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7½ කට නොඅඩු ප්‍රමාණයක් ;

(ආ) 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1990 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7½ කට නොඅඩු ප්‍රමාණයක් ; සහ

(ii) 1990 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7½ කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඇ) 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1991 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7½ කට නොඅඩු ප්‍රමාණයක් ; සහ

(ii) 1991 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7½ කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඈ) 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1992 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7½ කට නොඅඩු ප්‍රමාණයක් ; සහ

(ii) 1992 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7½ කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඉ) 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1993 අගෝස්තු මස 15 දින හෝ එදිනට පෙර, සියයට 7 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ

(ii) 1993 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට $7\frac{1}{2}$ කට නොඅඩු ප්‍රමාණයක් ;

ඒ අධිභාරය වශයෙන් ගෙවනු ලබන අවස්ථාවක—

1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1990 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර,

1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1991 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර,

1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1992 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර,

1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1993 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර, සහ

1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1994 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර,

ඔහු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණයට වැඩියෙන් ඒ අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ අතිරික්තය ඔහු විසින් ගෙවනු ලබන්නේ නම්, 3 වන වගන්තිය යටතේ කිරීමට ඔහුට නියම කරනු ලබන ගෙවීමක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ යම් දණ්ඩනයකට ඒ තැනැත්තා යටත් නොවිය යුතුය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.**

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "නිර්වාසික සමාගම", "තැනැත්තා", "ලාභ සහ ආදායම" යන වචන වෙනුවට "නිර්වාසික සමාගම", "ලාභ සහ ආදායම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "ආදායම් බද්ද" යන්නෙහි අර්ථ කථනයේ (v) වන ඡේදයේ "ඒ තැනැත්තා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වේ ; තවද" යන වචන වෙනුවට, "ඒ තැනැත්තා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වේ ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) "'දේශීය ආදායම් පනත' යන්නෙහි 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ," යන වචන සහ ඉලක්කම් වෙනුවට "'දේශීය ආදායම් පනත' යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ ; තවද," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(4) "දේශීය ආදායම් පනත" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ කථනය එකතු කිරීමෙන් :—

""තැනැත්තා" යන්නෙහි සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවක් ඇතුළත් වන නමුත් ශ්‍රී ලංකා මහ බැංකුව ඊට ඇතුළත් නොවේ.".

අතීතානුව බලපෑම.

8. මේ පනතේ 7 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 1989 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255 බෞද්ධාලෝක මාවත කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.